කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# එක්සත් ජනපද රාජ්‍ය ගොඩනැගීමෙහිලා ලිබරල්වාදී චින්තනයේ දායකත්වය පිළිබඳ විමර්ශනයක්

විභාග අංකය - FGS / PHIL / MC / 09 / 001

විෂය - දර්ශනය

2009 / 2010 පරීක්ෂණ වර්ෂය

සමාජ විද්‍යා පීඨය

කැලණිය විශ්වවිද්‍යාලයේ සාමාජීය විද්‍යාපති උපාධි පරීක්ෂණයෙහි අවශ්‍යතාවක් සපුරනු වස් ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනයකි.

## සාරාංශය

මෙම නිබන්ධනය තුළින් විමර්ශනයට ලක් වන්නේ ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය ගොඩනැගීම සඳහා ලිබරල්වාදී චින්තනය ලබාදුන් දායකත්වය පිළිබඳවය. ලිබරල්වාදය ප්‍රථම වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තුළ ස්ථාපිත වූයේ ඇමරිකා එක්සත් ජනපදය තුළය. ජනපද රාශියක් එම ව්‍යවස්ථාව වටා එක්වී ශක්තිමත් රාජ්‍යයක් බිහි කළේ ව්‍යවස්ථාව තුළ අන්තර්ගත වූ ලිබරල් ප්‍රතිපත්තීන් කෙරෙහි විශ්වාසය රඳවමිනි. මේ නිසා නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවලටද මෙම ව්‍යවස්ථාව අධ්‍යයනය කිරීම ඉතාමත් වැදගත් වනු ඇත. මෙම අධ්‍යයනයේ මූලික අරමුණු ත්‍රිත්වයකි. ලිබරල්වාදී චින්තනය ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ කෙතරම් දුරට අන්තර්ගතව ඇත්ද යන්න අධ්‍යයනය කිරීම, ඇමරිකානු ආණ්ඩුක්‍රම සම්පාදකයින් ව්‍යවස්ථාව සැකසීමේදී ලිබරල්වාදී මතවාද ප්‍රයෝජනයට ගත් ආකාරය විමසා බැලීම හා ඇමරිකාව තුළ ස්ථාවර දේශපාලන හා ආර්ථික තත්වයක් ඇත්තේ ලිබරල්වාදය මත එය ගොඩනැගී ඇති නිසාද යන්න විමසා බැලීම එකී අරමුණු වේ. ඇමරිකානු ආණ්ඩු ක්‍රමය තුළ පවත්නා වූ දැඩි ඒකාග්‍රකරණය ලිබරල්වාදී චින්තනය මත පදනම්ව නිර්මාණය වූවක්ද යන්න මෙහි අධ්‍යයන ගැටළුව වන අතර ඇමරිකානු ආණ්ඩු ක්‍රමය ඒකාග්‍රව ඇත්තේ ලිබරල්වාදය මත ගොඩනැගී ඇති නිසාය යන්න මෙහි උපන්‍යාසය ලෙස සැලකිය හැක. මෙම උපන්‍යාසය පරීක්ෂා කිරීම සඳහා ප්‍රාථමික දත්ත භාවිතයේ පවත්නා අපහසුව නිසා පොත්-පත්, ලිපි-ලේඛන ආදී ද්විතියික දත්ත උපයෝගී කරගනී. විග්‍රහ කරන්නා වූ ක්‍රමවේදය වන්නේ විස්තරාත්මක ක්‍රමවේදයයි. මෙම නිබන්ධනය තුළින් මතුවන වැදගත් කරුණු කිහිපයකි. ඇමරිකානු ව්‍යවස්ථාවට මූලික වශයෙන් බලපාන ලද්දේ 15 වන හා 18 වන සියවස දක්වා එංගලන්තය, ප්‍රංශය, ජර්මනිය, නෙදර්ලන්තය ආදී රාජ්‍ය කිහිපයක් තුළ ශතවර්ෂ තුනක පමණ කාලයක් තුළ ගොඩනැගුණු දර්ශනවාදයයි. එම දර්ශනවාදය ප්‍රායෝගිකව පරීක්ෂණයට භාජනය කෙරුණේ ඇමරිකා එක්සත් ජනපදය තුළය. ආදී කර්තෘවරු ප්‍රකාශ කළ ආකාරයට අභිනව ඇමරිකානු දේශය නව ආණ්ඩු ක්‍රමයක් පිළිබඳ පරීක්ෂණයක් වී නම් එහි පරීක්ෂණයට භාජනය කෙරුණේ ඇමරිකානු ව්‍යවස්ථාව නම් උපන්‍යාසයයි. ඇමරිකානු ව්‍යවස්ථාව හුදෙක් ඇමරිකානුවන් උදෙසා වූ ව්‍යවස්ථාවක් පමණක් නොව එය බටහිර ශිෂ්ටාචාරය අමුතුවෙන් හැඩගැස්වීමේ ව්‍යාපාරයේ එක් අංශයක් විය. මෙහා සම්බන්ධව මින් ඉදිරියට කළ හැකි පරීක්ෂණයක් ලෙස ශ්‍රී ලංකාවට මෙම දර්ශනවාදය කෙතරම් දුරට ප්‍රායෝගිකව භාවිතයට ගත හැකිද යන්න පරීක්ෂා කිරීම සිදු කළ හැක. විශේෂයෙන්ම ලංකාවට ව්‍යවස්ථා සංශෝධනයක හෝ නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව පිළිබඳ ප්‍රබල කතාබහක් මතු වී ඇති යුගයක මේ පිළිබඳව කෙරෙන අධ්‍යයනයක් ඉතාමත් කාලෝචිත වනු ඇත.

මුඛ්‍ය පද- ලිබරල්වාදය, ව්‍යවස්ථාව, ස්වභාවික අයිතිවාසිකම්, නිදහස, සීමිත ආණ්ඩුව